පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

**01. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

---------------------------

මෙම වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්ව සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ රු.1,296,693 ක් වැයකර ඉදිකර තිබූ ගොඩනැගිලි හා වැඩි දියුණු කිරීම් ගිණුම්ගත කර නොතිබුණි. | සියළු ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020 ගිණුම් වර්ෂයට අදාළව පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන හරහා ගිණුම්ගත කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 124 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | නැවත සමාලෝචනයක් සිදු කර ඒ අනුව වත්කම් හි නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන හරහා ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) | මුණමල්දෙනිය සතිපොල කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා වැය කළ රු.525,019 ක් ගිණුම්ගත කර නොතිබුණි. | සියළු ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020 සඳහා පිළියෙළ කරන මූල්‍ය ප්‍රකාශනය හරහා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,570,471 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.50,339,638ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2019 වර්ෂය | | | | වර්ෂය 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන් තුගත ආදායම් රු.000 | බිල්කළ ආදායම් රු.000 | රැස්කළ ආදායම් රු.000 | දෙසැම්බර් දිනට මුළු 31 හිඟය රු.000 | ඇස්තමේන්තු ගත ආදායම් රු.000 | බිල්කළ ආදායම් රු.000 | රැස්කළ ආදායම් රු.000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.000 |
| I. | වරිපනම් හා බදු | 4,117 | 3,221 | 3,282 | 35 | 3,724 | 3,581 | 3,512 | 96 |
| II. | බදු කුලී | 19,644 | 21,146 | 21,102 | 62 | 22,415 | 20,740 | 20,842 | 18 |
| III. | බලපත්‍ර ගාස්තු | 1,328 | 1,445 | - | - | 1,105 | 1,264 | 1,270 | - |
| IV. | වෙනත් ආදායම් | 123,178 | 131,404 | 174,630 | 64,262 | 119,365 | 130,182 | 107,765 | 77,058 |
| එකතුව | | 148,267 | 157,216 | 199,014 | 64,359 | 146,609 | 155,767 | 133,389 | 77,172 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,400,654 ක් හා මුද්දර ගාස්තු රු.56,033,658 ක් විය. ඉන් 2020 ජූනි 01 දින වන විට තවදුරටත් රු.51,033,658 ක මුද්දර ගාස්තු ආදායමක් ලැබිය යුතුව තිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු උසාවි දඩ රු.5,400,654 ක් හා මුද්දර ගාස්තු රු. 56,033,658 ක් පැවති බව පිළිගනිමි. මුද්දර ගාස්තු රු.51,033,658 ක් ලෙස තවදුරටත් ලැබිය යුතුය. මෙය සභාවට පාලනය කළ නොහැකි තත්ත්වයක් බව වැඩිදුරටත් දන්වා සිටිමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණ පහසුව හා සුභ සාධනය සඳහා සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් සමාලෝචිත වර්ෂය වන විට කාරණා 09 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | පනවාගත් හා වැළඳගත් අතුරු ව්‍යවස්ථා අනුව මෙහෙයුම් කටයුතු සිදුකළ යුතු අතර අවශ්‍යතාවය පරිදි නව අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | වර්තමානයේ පවතින අවශ්‍යතාවයන් මත හඳුනාගත් විෂය ක්ෂේත්‍ර 02 ක් ආවරණය කිරීමට අතුරු ව්‍යවස්ථා 02 ක් කෙටුම්පත් කර ඇති අතර, එක් කෙටුම්පතක් එහි නිවැරදි භාවය තහවුරු කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා මඟින් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත. |

#### (ආ) අයවැයගත කාර්යයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අයවැයගත රු.5,025,955 ක් වටිනා කර්මාන්ත 17 ක් ඉටුකර නොතිබුණි. | අයවැයගත කර්මාන්ත ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කර පැවතියද අධික වර්ෂාව හා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ හිඟකම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තක්සේරු වාර්තා අනුව සතොස පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලෙන් 2019 ඔක්තෝබර් සිට මාසික කුලිය රු. 70,000 ක් අය කළ යුතු වුවද මාසිකව රු. 60,000 බැගින් අයකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මාස 3 කට අදාළව රු. 30,000 ක පාඩුවක් සිදු වී තිබුණි. | නියමිත කුලිය අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | විගණනයෙන් දක්වා ඇති පරිදි රු.70,000 ක මාසික කුලිය සඳහා 2019.11.05, 2019.12.02 දින දරණ ලිපි මඟින් ඉදිරිපත් කර ඇති අභියාචනයන් හා වර්තමානයේ මෙම ගොඩනැඟිල්ලේ පවත්නා තත්වයන් සළකා අදාළ කුලී තක්සේරු සංශෝධනය ලැබෙන තෙක් පැරණි කුලිය අයකිරීමට තීරණය කර ඇත. |
| (ආ) | බහුකාර්යය ගොඩනැගිල්ලට අයත් කඩ කාමර 04 ක් සමාලෝචිත වර්ෂයේ වසා දමා තිබූ බැවින් රු. 1,053,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | කඩ කාමර ටෙන්ඩර් කර ආදායම් ඉපයීමට කටයුතු කළ යුතු වේ. | විගණනයෙන් පෙන්වා දී ඇති කඩකාමර බදුකරුවන් විසින් බදු ලබාගෙන ඇතත් කඩකාමර පාඩු ලබන ආකාරයෙන් පවත්වාගෙන යා නොහැකි බව දක්වමින් කඩකාමර නැවත සභාවට භාරදීමට කටයුතු කර ඇත. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.72,045,032 ක් වූ අතර ඉන් රු.10,187,613 ක් වසරකට වැඩි කාලයක් හිඟව පැවතුණි. | වර්ෂයේ බිල් කිරීම් වර්ෂය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ වරිපනම් බදු, අක්කර බදු හා ජල බදු අයකර ගැනීමට කටයුතු කරන අතර තවදුරටත් ප්‍රාග්ධන ආධාර වශයෙන් ලැබිය යුතු සමස්ථ වටිනාකම වන රු. 1,681,871.65 ක වටිනාකම ඉදිරියේදී ලබාගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. ලැබිය යුතු උසාවි දඩ රු. 5,400,654 ක් හා මුද්දර ගාස්තු රු. 51,033,658 ක් වන බව දන්වා සිටින මෙම තත්ත්වය සභාවට පාලනය කළ නොහැකි බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට වසරකට වඩා වැඩි කාලයක් නිරවුල් නොකර පැවති ගෙවිය යුතු ශේෂය රු.13,316,301 ක් වූ අතර එහි වසර 05 ට වැඩි විවිධ තැන්පතු ශේෂය රු.363,948 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | තවදුරටත් ගෙවිය යුතු මුදල කඩිනමින් ගෙවා අවසන් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ද්විතීය හා ප්‍රාථමික සේවාවන්ට අදාළව පුරප්පාඩු 19 ක් හා අතිරික්තතා 08 ක් ද පැවතුණු අතර කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 18 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට හා අතිරේක කාර්යය මණ්ඩලය අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | අතිරික්ත තනතුරු සඳහා අනුමැතියට යොමුකර ඇති අතර කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයන් මාස 06 කට වරක් ගිවිසුම් දීර්ඝ කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව බඳවාගෙන ඇති බව වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි. |

### (ආ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට නිශ්චිතව කාලය සඳහන් කළ නොහැකි රු.333,038 ක ණය ශේෂ 19 ක් හා වසර 01 සිට 02 දක්වා කාල පරාසයකට අදාළ රු.8,151ක් වූ ශේෂ දෙකක් විය. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | එක් හිඟ ණය මුදලක් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අය කිරීමට කටයුතු යොදා ඇත. ඉතිරිය සඳහා සාධාරණීකරණ කමිටුවක් මගින් ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව මෙයින් කාරුණිකව දන්වා සිටිමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් දේපල තක්සේරුව වසර 05 කට වරක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදාල බල ප්‍රදේශය ඇතුළත් සිතියම පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව නව වරිපනම් තක්සේරුව සිදුකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව මෙයින් දැනුම් දෙමි. |
| (ආ) | වසර 32 ක කාලයක් ගිවිසුමකින් තොරව කඩ කාමර 04 ක් බදු දී තිබුණු අතර කඩ කාමර 12 ක් මාස 03 සිට අවුරුදු 02 මාස 04 ක කාලයක් ගිවිසුම්වලින් තොරව පැවතුණි. | විධිමත් ගිවිසුම් මඟින් සභා දේපල බදු දිය යුතු අතර ගිවිසුම් කාලීනව වෙනස් කිරීමට කටයුතු කළ යුතු වේ. | ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී දන්වා ඇතත්, ගිවිසුම් අත්සන් කිරීම සඳහා කටයුතු කර නොමැත. |

**3.5 වත්කම් කළමනාකරණය**

------------------------------

**3.5.1 පවරා නොගත් වත්කම්**

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට පවරා නොගත් සුසාන භූමි 134 ක් විය. | පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සුසාන භූමි 08 ක් මැනුම් කටයුතු කර මායිම් ගල් දමා පිඹුරුපත් සකස් කර ඇති අතර මෙම සුසාන භූමි පවරා ගැනීම සම්බන්ධයෙන් මේ වනවිට කටයුතු සම්පාදනය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

### 3.5.2 නිශ්ක්‍රීය වත්කම්

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------------- | ------------------------------ | ---------------------------------- |
| මාවී ඇල සතිපොළ 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොවන බැවින් එහි ඉදිකිරීම් හා සවිකිරීම් විනාශ වෙමින් පැවතුණි. | සභාව සතු නිශ්ක්‍රීය වත්කම් හඳුනාගෙන ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මාවීඇළ සතිපොළ විගණන පරීක්ෂාවේදී නිශ්කාර්යව පැවතීම හේතුවෙන් වල් බිහිවී තිබූ බවත්, ගොඩනැගිලි සඳහා සවිකර තිබූ විදුලි බුබුළු, විදුලි උපකරණ හා උපාංග නොමැතිව තිබූ බවද පිළි ගනිමි. වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රතිපාදන මත ඉදිවූ මාවී ඇළ සතිපොළ සියළු පහසුකම්වලින් සමන්විත වේ. |